සමාජ සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් හඳුනාගත හැකි දිවි තොර කරගැනීම් වාර්තා කළ යුත්තේ, එවැනි ගැටළුවක් ඇති බව සමාජයට පෙන්වා දීම සඳහායි. නමුත්, එහිදී දිවි තොර කරගැනීම් වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තිරව පිළිපැදීම අවශ්‍ය වන්නේ, එවැනි සිදුවීම් ප්‍රවේසම් රහිතව වාර්තා කිරීම ඔස්සේ අනුකාරක දිවි තොර කරගැනීම් ඇතිවීමත්, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමත් වැළැක්වීම උදෙසායි.

උදාහරණයක් ලෙසින් පහත පුවත් වාර්තාව ගත හැක.

මෙහි දිවි තොර කරගත් ආකාරය දක්වා තිබීම මගින් දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු එම ක්‍රමය උපයෝගී කරගැනීමට උත්ප්‍රේරණය ලැබීමේ අවදානමක් පවතී. එසේම 'කලමනාකරු සිය කැමැත්තෙන්ම මරුත් සමග ගිහින්' වැනි සිරස්තලයක් මගින් දිවි තොර කරගැනීම යම් කිසි ලෙසකින් උත්කර්ෂයට නැංවෙන්නේ නැතිදැයි අපට විමසීමට සිදුවේ. දිවි තොර කරගන්නා බවට ලියූ සටහන් ආදිය ප්‍රකාශ කිරීම ඔස්සේද දිවි තොරකර ගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුට උත්ප්‍රේරණයක් ලැබිය හැක.

අවසන් වශයෙන්, මෙවැනි පුවත් වාර්තාවන් හා හදිසි උපකාරක අංක පළ කිරීම අතිශයින්ම වැදගත් වේ. මන්දයත්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති වෙනත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට අවස්ථාවක් ලැබිය හැකි බැවිනි.

මෙම දිවි තොර කරගැනීම පිළිබඳ පුවත එදින ඉංග්‍රීසි පුවත්පත් තුළ පළවී නොතිබූ බවද සඳහන් කළ යුතු වේ.

හදිසි උපකාරක අංක:
*1333-CCC line
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860 *ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**
**See Less**